සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

45 | S | II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**12 ශ්‍රේණිය**
**Grade 12**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Civilization - II**

**පැය තුනයි**
**Three hours**

**සැලකිය යුතුයි :**

- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි. 1, 2, 3 ප්‍රශ්නවලින් එක් කොටසකට ලකුණු 4 බැගින් ද, (4), (5), (6), (7), (8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

## I කොටස

(01) i. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව වෛශ්‍ය වර්ණයට හිමි වූ ස්වධර්ම නම් කරන්න.

ii. ආශ්‍රම ධර්ම සැකෙවින් හඳුන්වන්න.

iii. බුද්ධ කාලීන මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iv. බුදු රජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීම් දෙකක් ගෙන හැර දක්වන්න.

v. බුදුරජාණන් වහන්සේ සතු වූ අෂ්ට විද්‍යා නම් කරන්න.

(02) i. බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ හතරක් නම් කරන්න.

ii. මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සැකෙවින් හඳුන්වන්න.

iii. ''අරහං බුදු ගුණය'' හඳුන්වන්න.

iv. ''නකුලමාතාවගේ'' චරිතය හඳුන්වන්න.

v. දස රාජ ධර්ම පිළිවෙලින් නම් කරන්න.

(03) i. ආකාරවතී ශ්‍රද්ධාව හඳුන්වා දෙන්න.

ii. ''මුදිතා'' බ්‍රහ්ම විහරණයෙහි වැදගත්කම අගය කරන්න.

iii. අටසිල් පිළිවෙලින් නම් කරන්න.

iv. ශාසනික උන්නතිය සඳහා සැරියුත් මහරහතන් වහන්සේගෙන් සිදු වූ සේවය සැකෙවින් විස්තර කරන්න.

v. බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ස්වධර්ම සංකල්පය තුළින් ශුද්‍රයාට අහිමි වූ කාර්යයන් ගෙන හැර දක්වන්න.

## II කොටස

(04) i. ස්වධර්ම සංකල්පය පිළිබඳ බ්‍රාහ්මණ මතය විමර්ශනය කරන්න.

ii. බමුණන්ගේ වර්ණ ධර්ම සංකකල්පය බුදු දහමින් ප්‍රතික්ෂේප වූ ආකාරය විවිධ සාධක ඔස්සේ පැහැදිලි කරන්න.

(05) i. රාජාණ්ඩු පාලනයක දැකිය හැකි වූ විශේෂ ලක්ෂණ බුද්ධ කාලීන දේශපාලන පසුබිම ඇසුරෙන් පැහැදිලි කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ සමඟ සබඳතා පැවැත් වූ පාලකයින් දෙදෙනෙක් බුදුසසුනේ උන්නතියට දායක වූ ආකාරය විස්තර කරන්න.

(06) i. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ශුද්‍රයන්ගේ ආගමික සාමාජික ආර්ථික හා අධ්‍යාපනික අයිතිවාසිකම් අහිමි වූ ආකාරය විමර්ශනය කරන්න.

ii. ''කාන්තාව මවක මෙන්ම බිරිඳක ලෙස ගෞරවයට ලක් කළේ බුදු දහමෙනි.'' පැහැදිලි කරන්න.

(07) i. සහජීවනයෙන් යුතු සමාජයක් බිහි කිරීම සඳහා සතර සංග්‍රහ වස්තු උපයෝගී කරගත හැකි දැයි විමර්ශනය කරන්න.

ii. ජනතා හිතවාදී පාලනයක් සඳහා දසරාජධර්මවල උපයෝගීතාවය ඇගයීමට ලක් කරන්න.

(08) i. බුද්ධකාලීන භාරතීය සමාජයෙහි පුද්ගල ස්වාමිත්වයට හා ස්වාධීනත්වයට බාධාකාරී වූ ආගමික ඉගැන්වීම් මොනවාදැයි පරීක්ෂා කරන්න.

ii. 'පුද්ගල ස්වාමිත්වය හා ස්වාධීනත්වය ඇගයීමට ලක්කළේ බුදු සමයෙනි'' විමර්ශනය කරන්න.

The National e-learning Portal for the General Education